# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1046 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 22/06/2024<br>පැය 1400 |

## මාධ්‍ය නිවේදනය

### දිය අනතුරු වලින් ජීවිත බේරා දුන් පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ නිලධාරීන් පොලිස්පතිතුමා විසින් ඇගයීමට ලක් කිරීම - පොලිස් මූලස්ථානය .

2024 වර්ෂයේ පොසොන් උත්සවයට සමගාමීව මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන හා දිය මූලාශ්‍ර භාවිතයට ගනු ලබන අනුරාධපුර, පොළොන්නරුව, දඹුල්ල හා තංගල්ල වශයෙන් කලාප 04 ක් සඳහා ජීවිතාරක්ෂක නිලධාරීන් යෙදවීමට කටයුතු කල අතර පූජනීය ස්ථාන වෙත පැමිණ ජල මූලාශ්‍රයන් භාවිතා කරනු ලබන මහජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන් පැය 24 පුරා ක්‍රියාත්මක වෙමින් කටයුතු කරනු ලබයි.

මෙම පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් පසුගිය දින කිහිපය තුලදී අනුරාධපුරය බසවක්කුලම වැව ආශ්‍රිතව හා දඹුල්ල කණ්ඩලම වැවෙහි දියේ ගිලී අනතුරට පත් පුද්ගලයින් 05 දෙනෙකුගේ දිවි ගලවා ගැනීමට සමත් වූ අතර එම නිලධාරීන් දියේ ගිලී අනතුරට පත් වූවන්, ඥාතීන්, විවිධ ප්‍රදේශයන්ගෙන් පැමිණි බැතිමතුන්ගේ ගෞරවයට හා ඇගයීමට පාත්‍ර විය.

පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා බසවක්කුලම ජීවිත ආරක්ෂක ඒකකය වෙත ගොස් 2024.06.20 හා 21 වන දිනයන්හි බසවක්කුලම වැවේ දිය නාමින් සිටියදී වයස අවුරුදු 13ක පිරිමි දරුවෙකු සහ වයස අවු 19 තරුණයෙකුගේ ජීවිතය බේරා දුන් පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ නිලධාරීන් හමු වී ඔවුන් සිදු කල කීර්තිමත් රාජකාරිය ඇගයීමට ලක් කල අතර ඉදිරියේදී එම නිලධාරීන් සඳහා පොලිස් ත්‍යාග අරමුදලින් මූල්‍යමය ත්‍යාගයන් හා පොලිස්පති ප්‍රශංසා ලබා දීමට කටයුතු කරන බවද දන්වා සිටින ලදී. මෙම අවස්ථාවේදී ජීවිතාරක්ෂක නිලධාරීන් විසින් පාසල් ළමුන් වෙනුවෙන් සිදුකරගෙන යනු ලබන ජීවිතාරක්ෂක පුහුණු වැඩමුළුද පොලිස්පතිතුමන්ගේ විශේෂ ඇගයීමට ලක් කරන ලදී.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප




POLICE
LIFE SAVING


AIA
POLICE


AIA




**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**